මහානාම විද්‍යාලය - කොළඹ 03

අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ) විභාගය 13 වසර 1 වන වාර පරීක්ෂණය

General certificate of education (Advanced level) Examination , Grade 13 First Term Test

ජීව විද්‍යාව I Biology I	2023	පැය 2 2 hours

නම: .... විභාග අංකය : ....

- සියලුම ප්‍රශ්න සඳහා වඩාත් සුදුසු පිළිතුර තෝරා දී ඇති කොලයෙහි ලකුණු කරන්න

(1) නියුක්ලෙයික් අම්ල සෑදීමේදී ඇතිවන ෆොස්පොඩයිඑස්ටර් බන්ධන ඇති වන්නේ නියුක්ලියෝටයිඩ දෙකෙහි කුමන ස්ථානවල ඇති වන සංඝනන ප්‍රතික්‍රියාවෙන් ද?

1) එක් නියුක්ලියෝටයිඩයක පොස්පේට් හි ඇති -OH කාණ්ඩය , නයිට්‍රජනීය භෂ්මයේ 3වන C පරමාණුවට සම්බන්ධ -OH කාණ්ඩය සමගය.
2) එක් නියුක්ලියෝටයිඩයක පෙන්ටෝස් සීනි වල 5වන C පරමාණුවට සම්බන්ධ -OH කාණ්ඩය වෙනත් නියුක්ලියෝටයිඩයක පොස්ෆේට්හි ඇති -OH කාණ්ඩය සමගය.
3) එක් නියුක්ලියෝටයිඩයක පොස්පේට්හි ඇති -OH කාණ්ඩයක් වෙනත් නියුක්ලියෝටයිඩයක පෙන්ටෝස් සීනිවල 3වන C පරමාණුවට සම්බන්ධ -OH කාණ්ඩය සමඟය.
4) එක් නියුක්ලියෝටයිඩයක පොස්පේට්හි ඇති -OH වෙනත් නියුක්ලියෝටයිඩයක පෙන්ටෝස් සීනිවල 4වන C පරමාණුවට සම්බන්ධ -OH කාණ්ඩය සමගය.
5) එක් නියුක්ලියෝටයිඩයක ෆොස්ෆේට්හි ඇති -OH කාණ්ඩය පෙන්ටෝස් සීනිවල 2වන C පරමාණුවට සම්බන්ධ -OH කාණ්ඩය සමඟය

(2) ආරක්ෂක කෘත්‍ය ඉටු කරන ප්‍රෝටීනයකි;

1) හිමොග්ලොබින්
2) මයෝග්ලොබින්
3) මස්තු ඇල්බියුමින්
4) ඕවල්බියුමින්
5) ඉමියුනෝග්ලොබියුලින්

22 A/L අපි [papers g

(3) පිළිවෙලින් ඇල්ඩො කාණ්ඩයක් හා කීටෝ කාණ්ඩයක් අඩංගු හෙක්සෝස වන්නේ;

1) ග්ලූකෝස්, ගැලැක්ටෝස්
2) රිබ්‍යුලෝස් , ෆ්‍රක්ටෝස්
3) රිබියුලෝස්, රයිබෝස්
4) ග්ලූකෝස් , රයිබෝස්
5) ග්ලූකෝස්,ෆ්‍රක්ටෝස්

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

(4) ඌනනයේ සිදුවීම්වලට අදාලවූ ඌනනයේ අවධිය පිළිබඳව සත්‍ය වන්නේ;

1) උපාගම පට සංකීර්ණය සෑදීම - යෝග කලාව I
2) මංසල - වියෝග කලාව I
3) DNA සංස්ලේෂණය - ප්‍රාක්කලාව I
4) වර්ණ දේහාංශ සෙන්ට්‍රොමියරයෙන් වෙන්වීම - වියෝග කලාව II
5) ප්‍රවේණිකව සර්වසම දුහිතෘ න්‍යෂ්ටි දෙකක් සෑදීම - අන්ත කලාව I

(5) පහත කවර ප්‍රකාශයක් සුන්‍යෂ්ටික සෛල පිළිබඳව නිවැරදිවේද?

1) ප්ලාස්ම පටලයේහි පවතින සම්පූරක ප්‍රෝටීන් සියල්ල පොස්පොලිපිඩ ද්විත්ව ස්ථරයේ විනිවිද ගොස් ඇත.
2) 70s රයිබසෝම සෛල ප්ලාස්මයේ ඇත.
3) තද සන්ධිය මගින් අන්තර්සෛලීය අවකාශ වලින් අන්ත:සෛලීය තරල කාන්දු වීම වළක්වයි.
4) න්‍යශ්ටික තලාව තැනී ඇත්තේ අතරමැදි සූත්‍රිකා වලිනි.
5) සෛල යුෂයේ සංයුතිය සයිටොසොලයේ සංයුතියට බොහෝ දුරට සමානය.

(6) ප්‍රභාසංස්ලේෂණයේ අවශෝෂක හා ක්‍රියා වර්ණාවලි සම්බන්ධයෙන් සාවද්‍ය වනුයේ;

1) ක්ලෝරොෆිල් a මගින් දම්, නිල් ,රතු ආලෝක වැඩි වශයෙන් අවශෝෂණය කරයි.
2) ක්ලෝරොෆිල් b මගින් නිල් ආලෝක කලාපයේ දී ක්ලෝරොෆිල් a ට වඩා වැඩි අගයන් වලින් ආලෝකය අවශෝෂණය කළ හැකිය
3) කැරොටිනොයිඩ මගෙන් වැඩියෙන්ම අවශෝෂණය කරන්නේ රතු ආලෝකයයි.
4) අඩුම කාර්යක්ෂමතාවයකින් ප්‍රභාසංස්ලේෂණය සිදු කරන්නේ කොළ හා කහ ආලෝකයන්හිදීය.
5) ඔක්සිජන් වැඩිම ප්‍රමාණයක් නිදහස් කරනුයේ නිල්, දම් ආලෝකය ආශ්‍රිතවයි.

22 A/L අපි [papers grp]

(7) හරිතලවයක පංජරය තුළ සිදු නොවන්නේ;

1) RuBP පුනර්ජනනය
2) NADPH ඔක්සිකරණය
3) කාබොක්සිල්කරණය
4) ATP සංස්ලේෂණය
5) 3- පොස්පොග්ලිසරේට් ඔක්සිහරණය

(8) ප්‍රභාසංස්ලේෂණයට අදාල සත්‍ය ප්‍රකාශය තෝරන්න;

1) ජලයෙ ප්‍රභාවිච්ඡේදනයෙන් චක්‍රීය ඉලෙක්ට්‍රෝන පරිවහනයට ඉලෙක්ට්‍රෝන සපයයි.
2) ග්ලිසර්ඇල්ඩිහයිඩ්-3- පොස්පේට් ශුද්ධ අණුවක් සෑදීමට කැල්වින් චක්‍රය 6 වතාවක් සිදු විය යුතුය.

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

3) තයිලකොයිඩ පටල මත ප්‍රභාපද්ධති II ආශ්‍රිතව චක්‍රීය හා නිර්චක්‍රීය ඉලෙක්ට්‍රෝන පරිවහනය සිදුවේ.
4) C4 ශාකවල CO2 තිර කිරීමේදී PEP කාබොක්සිලේස් එන්සයිමය පමණක් උත්ප්‍රේරක කෘත්‍ය කරයි .
5) RuBP පුනර්ජනනීය ATP වැයවේ.

(9) එන්සයිම සම්බන්ධයෙන් පහත ප්‍රකාශ සලකා බලා පිළිතුර තෝරන්න.

A) එන්සයිම ක්‍රියා කරනුයේ සජීවී සෛල තුළ පමණි.
B) බොහෝ එන්සයිම උත්ප්‍රේරක ප්‍රතික්‍රියා ප්‍රතිවර්ත වේ.
C) සමහර එන්සයිම ප්‍රතික්‍රියා උත්ප්‍රේරණය සඳහා ප්‍රෝටීන නොවන සාධක අවශ්‍යයි.

ඉහත ප්‍රකාශවලින් සත්‍ය වන්නේ;
1) A හා B පමණි.
2) A හා C පමණි.
3) B හා C පමණි.
4) A, B, C පමණි.
5) සියල්ලම අසත්‍යයි.

(10) සෛලීය ස්වායු ශ්වසනය පිළිබඳ අසත්‍ය වනුයේ;

1) ග්ලයිකොලිසියේදී සහඑන්සයිම ඔක්සිහරණය සිදුවේ.
2) සිට්‍රික් අම්ල චක්‍රය අවසන් වන විට ග්ලූකෝස් අණුව සම්පූර්ණයෙන් ඔක්සිකරණය වී අවසානය.
3) පයිරුවේට් එක් අණුවකින් සිට්‍රික් අම්ල චක්‍රයේදී උපස්තර පොස්පොරිල්කරණයෙන් 2ATP නිපදවේ.
4) ඉලෙක්ට්‍රෝන පරිවහන දාමය මියර හරහා ඉලෙක්ට්‍රෝන හා ප්‍රෝටෝන චලනයට දායක වන ප්‍රෝටීන හා ප්‍රෝටීන නොවන අණු ශ්‍රේණියකින් සමන්විතය.
5) පයිරුවේට් අණු පටලය හරහා සක්‍රීය පරිවහනයෙන් මයිටොකොන්ඩ්‍රියා තුළට ඇතුළු වේ.

(11) ශ්වසනයේ ග්ලයිකොලිසියේදී ප්‍රෝටීන, කාබෝහයිඩ්‍රේට් හා මේද වල භාවිතය පිළිබඳව පහත ගැලීම් සටහන් සලකා බලා වැරදි සටහන තෝරන්න.

1) ප්‍රෝටීන → ඇමයිනෝ අම්ල → පයිරුවේට් ($\downarrow$ NH_3)
2) ප්‍රෝටීන → සීනි → ග්ලූකෝස් → G3P → පයිරුවේට්
3) කාබෝහයිඩ්‍රේට → සීනි → ග්ලූකෝස් → G3P → පයිරුවේට්
4) මේද → ග්ලිසරෝල් → G3P → පයිරුවේට්
5) මේද අම්ල → ග්ලූකෝස් → G3P → පයිරුවේට්

22 A/L අපි [papers grp]

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

(12) ජෛව විවිධත්ව පරිණාමය සම්බන්ධ අසත්‍ය ප්‍රකාශය වන්නේ;

1) ජෛව පරිණාමයේ දී ඇති වූ කාබනික අණුවල ප්‍රභවයක් ලෙස උල්කාපාත සැලකිය හැක.
2) ලිපිඩවලින් වටවූ ආශයිකා තුළට RNA ගොනු වීමෙන් ප්‍රාක් සෛලය ඇති වූ අතර මුල්ම ජාන වූයේ RNA ය.
3) මොලස්කාවන්, නිඩරයාවන් පසු - ප්‍රොටෙරෝසොයික් අවධියේ දී බිහි විය.
4) භෞමිකව ජීවිතය ආරම්භකළ මුල්ම ආත්‍රපෝඩාවෝ වන අතර ඔවුන්ගේ පූර්වජයන් වසර මිලියන 700කට පෙර ඇති විය
5) වායුගෝලීය ඔක්සිජන් සාන්ද්‍රණය ඉහළ නැගීම ආකියන් ඉයෝනයේ ආරම්භ විය.

(13) ද්විපද නාමකරණයේ දී භාවිතා වන සම්මත නීතියක් නොවන්නේ;

1) සෑම විශේෂයකට ම ඝන නාමයක් හා සුළු නාමයක් පවතින අතර එම නාම දෙකේ එකතුව විශේෂයේ විද්‍යාත්මක නාමය සාදයි.
2) ගණ නාමයේ මුල් අකුර ඉංග්‍රීසි කැපිටල් අකුරක් විය යුතු අතර සුළු නාමය සිම්පල් අකුරින් ලිවිය යුතුය.
3) නාමය ලතින් හුරුවක් ඇති නාමයක් විය යුතු අතර එය රෝමන් අක්ෂර භාවිතයෙන් ලිවිය යුතුයි.
4) සෑමවිටම විද්‍යාත්මක නාමයක් යටින් ඉරක් ඇඳිය යුතුය.
5) විද්‍යාත්මක කාර්යවලදී නාමය හඳුන්වාදුන් විද්‍යාඥයාගේ නම ඉංග්‍රීසි කැපිටල් අකුරකින් කෙටිකර දැක්වීමෙන් හෝ සම්පූර්ණ නම ලෙසින් හෝ හෝ නාමය අගින් දක්වනු ලැබේ.

(14) මොලුස්කා වංශයට අයත් සතුන් සතු ලක්ෂණයක් නොවේ;

1) මෘදු දේහධාරී හා ඛණ්ඩනය සහිතය.
2) සංචරණය සඳහා පේශමය පාදය භාවිත කරයි.
3) ප්‍රාවරණය මගින් කවචය ශ්‍රාවය කරයි.
4) අන්තරාංග ගොනුව තුළ අභ්‍යන්තර අවයව බොහෝ අන්තර්ගතය.
5) අසමමිතික සතුන් ද අන්තර්ගතය.

(15) අසත්‍ය ප්‍රකාශය තෝරන්න.

1) බාහිර ද්‍රාවණයක ජල විභවය සෑමවිටම ද්‍රාව්‍ය විභවයට සමාන වේ.
2) ශාක සෛලයක පීඩන විභවය ඇතැමවිට ඍණ අගයක් ගනී.
3) ආරම්භක විශූනතාවයේ පවතින අවස්ථාවේ සෛලයක් ශූනතා පීඩනයට ලක් නොවේ.
4) විශූන සෛලයක ජල විභවය එහි ද්‍රාව්‍ය විභවයට සමාන වේ.
5) ශූන ශාක සෛලයක ජල විභවය සංශුද්ධ ජලයේ ජලවිභවයට සමාන විය හැකිය.

22 A/L අපි [papers grp]

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

(16) පහත ලක්ෂණ සහිත ප්‍රෝටිස්ටා ජීවීන් අනුපිළිවෙළින් සඳහන් වන්නේ;

A) බහු සෛලික තලස වායු පිරුණු බල්බ හැඩැති ඉපිල්ලි තිබීම.
B) අවුල්පාසුව සහිත බහුසෛලික තලසක් තිබීම.
C) මෛඛ ඇලියක් තිබීම.

1) *Sargassum, Gelidium , Amoeba*
2) *Sargassum, ulva , Euglena*
3) *Sargassum, Pogonatum, Paramecium*
4) *Ulva, Gelidium , Paramecium*
5) *Sargassum, Gelidium . Paramecium*

(17) පහත ආවේණික ලක්ෂණ සහිත ශාක සඳහා උදාහරණයක් නොවන්නේ;

1) තාල වර්ගයට අයත් ශාකපත්‍ර වලට සමාන පෙනුමක් ඇති පත්‍ර ඇත - *Pinus*
2) සංසේචනයෙන් පසු ඩිම්බකෝෂය ඵලයක් බවට පත්වේ - *Oryza*
3) ආවෘත බීජක ඵලයකට සමාන පෙනුමක් ඇති බීජ ඇත - *Gnetum*
4) වෙන් වෙන්ව පවතින කේතුවල බීජාණු ආකාර දෙකක් නිපදවයි - *Pinus*
5) බීජ රහිත සනාල ශාකවලට සමාන කශිකාධර ශුක්‍රාණු ඇත - *Cycas.*

(18) පහත ලක්ෂණ පෙන්වන Animalia රාජධානියේ ඇති සත්ත්ව වංශය තෝරන්න.

a) ඛණ්ඩනයක් හෝ ශිර්ෂණයක් නොතිබීම.
b) ඵලක වලින් සමන්විත අන්ත: සැකිල්ල.
c) ක්ෂීනවූ සංසරණ පද්ධතියක් සහිතයි.

1) Platyhelminthes
2) Annelida
3) Arthropoda
4) Mollusca
5) Echinodermata

22 A/L අපි [papers

(19) *Selaginella* ශාකයේ ජීවන චක්‍රයෙහි;

1) කලලය ස්වාධීනව වැඩෙමින් ලපටි බීජාණු ශාකය බවට පත්වේ.
2) ජන්මාතු ශාකය ද්වීගෘහීය.
3) බීජානුධානිවල බීජාණු සෑදීමේදී අනුනන විභාජනය සිදුවේ.
4) ජන්මාණු ශාක පරම්පරාව ප්‍රමුඛය.
5) ශුක්‍රාණුවලට අණ්ඩානුධානි කරා ලඟාවීමට බාහිර ජලය අවශ්‍ය නොවේ.

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

(20) සපුෂ්ප ශාක පිළිබඳ සාවද්‍ය වනුයේ;

1) සමහර ශාකවල බීජ විකසනය වනුයේ සංසේචනයෙන් තොරවයි.
2) ශාක වර්ධක ද්‍රව්‍ය මගින් ඇතැම් ශාකවල පාතනෝප්ලනය ප්‍රේරණය කළ හැක.
3) පරිනත කලල කෝෂය සෛල 7 කින් යුක්තය.
4) පුෂ්පයේ රේණුව ක්ෂුද්‍ර බීජාණුධානියට සම්ප්‍රභව වේ.
5) බොහෝ ආවෘත බීජක ශාක පරපරාගනයට අනුවර්තනය පෙන්වයි.

(21) පාලක සෛල පිළිබඳව සාවද්‍ය ප්‍රකාශය තෝරන්න;

1) ආවෘත බීජ ශාකවල සාමාන්‍යයෙන් බෝංචි බීජ හැඩයක් ගනී.
2) විශේෂණය වූ ආරීය බිත්ති දරයි.
3) ශූනවීමට උපකාරක සෛල දායක වේ.
4) පූටිකා සිදුර වටකරන සෛල බිත්තිවල සෙලියුලෝස් ශුද්‍ර තන්තු බහුලව පිහිටයි.
5) ආලෝකය ඇතිවිට ජල විභවය අඩු වෙයි.

(22) විවිධ උත්තේජවලට ශාක දක්වන ප්‍රතිචාර සම්බන්ධ අසත්‍ය වගන්තිය තෝරන්න;

1) බීජ පුරෝහනය ෆයිටොක්‍රෝම් ප්‍රභා ප්‍රතිග්‍රාහක මඟින් යාමනය කෙරේ.
2) ආලෝකයේ ඇති රතු සහ නිල් වර්ණ ප්‍රභාරූපජනනය යාමනයට වඩාත් වැදගත් වේ.
3) නිල් ආලෝක ප්‍රභා ප්‍රතිග්‍රාහක මගින් ආලෝකප්‍රේරණයෙන් පූටිකා විවරවීම ආරම්භ කරයි.
4) ස්පර්ශය හේතුවෙන් *Mimosa pudica* උපාදාන ක්ෂණිකව ශූනවේ.
5) ධූරරක්තකිරණවලට : රතු ආලෝකය අනුග්‍රහය වැඩිවීමෙන් ශාකයේ අතු බෙදීම උත්තේජනය වේ.

(23) ශාක වර්ධක ද්‍රව්‍යවල කෘත්‍ය සම්බන්ධයෙන් නොගැලපෙන වනුයේ;

1) සයිටොකයිනින	-	වර්ධනය නිශේධනය කරයි.
2) එතිලීන්	-	පත්‍ර ඡේදනය දිරිගන්වයි
3) ඇබ්සිසික් අම්ලය	-	බීජ සුප්තතාව දිරිගන්වයි
4) ගිබරලින	-	පරාග විකසනය උත්තේජනය කරයි.
5) ඔක්සීන	-	අග්‍රස්ථ ප්‍රමුඛතාව දිරිගන්වයි.

(24) දී ඇති ශාක කොටසක හරස්කඩ වනුයේ;



22 A/L අපි [papers grp]

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

1) ඒක බීජ කඳක ප්‍රාථමික ව්‍යුහය
2) ඒක බීජ මූලක ප්‍රාථමික ව්‍යුහය
3) ද්විබීජ කඳක ප්‍රාථමික ව්‍යුහය
4) ද්විබීජ මූලක ප්‍රාථමික ව්‍යුහය
5) ද්විබීජ කඳක ද්විතීක ව්‍යුහය

(25) ශාක පෝෂණය පිළිබඳ අසත්‍ය වන්නේ;

1) හරිත ශාක ප්‍රභා ස්වයංපෝෂී වේ.
2) සහභෝජිතාව ජීවී විශේෂ දෙකටම වාසි ගෙන දේ.
3) *Utricularia* මාංශ භක්ෂක ශාක විශේෂයකි.
4) පරපෝෂිතාව එක් ජීවී විශේෂයකට පමණක් හානි සිදු කරයි.
5) නයිට්‍රජන් ඌන පස්වල මාංශ භක්ෂක ශාක වර්ධනය වේ.

(26) සත්ව පටක සම්බන්ධ සත්‍ය වන්නේ;

1) ස්නායු පද්ධතියේ ව්‍යුහමය සහ කෘත්‍යමය ඒකකය නියුරෝනය වේ.
2) කාටිලේජ පටකය තුළ ස්නායු තන්තු හා රුධිරවාහිනී ඇත.
3) අපිච්ඡද පටකය සියලුම සෛල සෑමවිටම දරණු පටලයක් මත පිහිටයි.
4) කංකාල පේශී හා හෘත්පේශී සෛල සාකොමියරය පිහිටීම මගින් විලිඛිත වේ .
5) තන්තුමය සම්බන්ධක පටක විශාල පූරකයක් සහිතයි.

(27) මානව ආහාර ජීර්ණ පද්ධතිය හා සම්බන්ධ කවර ප්‍රකාශය සත්‍යවේ ද?

1) මානව ආහාර මාර්ගයේ චලන සඳහා දායක වනුයේ සිනිඳු පේශී පමණි.
2) මුඛ කුහරයට කේඨය නිදහස් වීම ස්නායු ප්‍රතීකයක් මගින් සිදුවේ.
3) මුඛය හා ආමාශය දේහයේ විශිෂ්ට ආරක්ෂාව සඳහා වැදගත් කාර්යයක් ඉටු කරයි
4) ආහාර ජීර්ණයෙහි වැඩි කොටසක් ශුන්‍යාන්ත්‍රිකය තුළ සිදුවේ.
5) ආමාශයේ මත්ගැමේ ක්‍රියා යාන්ත්‍රික ජීරණය පහසු කරයි.

(28) මිනිසා විසින් අධිග්‍රහණය කරන ආහාරයේ ප්‍රෝටීන ජීර්ණය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය කුමක්ද?

1) අන්නස්‍රෝතය තුළදී ප්‍රෝටීනවල රසායනික ජීරණය ආරම්භ කෙරේ.
2) ට්‍රිප්සීන්, ප්‍රෝටීන ඇමයිනෝ අම්ල බවට පත් කෙරේ.
3) පෙප්සිනෝජන් මගින් පොලිපෙප්ටයිඩ , කුඩා පොලිපෙප්ටයිඩ බවට ජීරණය කෙ
4) ඩයිපෙප්ටයිඩේස්, කුඩා පොලිපෙප්ටයිඩ ඇමයිනෝ අම්ල බවට පත් කරයි.
5) කයිමොට්‍රිප්සීන්, කුඩා පෙප්ටයිඩ ඇමයිනෝ අමල බවට පත් කරයි.

22 A/L අපි [papers grp]
iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

(29) පහත ECG සටහනෙහි කෝෂිකා විධ්‍රැවනය පෙන්නුම් කරන්නේ;



1) P
2) R
3) T
4) QRS මගින්.
5) ඉහත ක්සිවක් නොවේ.

22 A/L අපි [papers grp]

(30) මානව ශ්වසන පද්ධතිය හා ස්වසන යාමනය පිළිබඳ අසත්‍ය වන්නේ;

1) ආශ්වාසයෙදී පර්ශුපේශි, අන්තර්පර්ශුක පේශි හා මහාප්‍රාචීරය සංකෝචනය වේ.
2) පුරුෂයකුගේ ජීව ධාරිතාවය 4800ml වේ.
3) සිගරට් දුමෙහි ඇති හයිඩ්‍රජන් සයනයිඩ් පක්ශ්මවල නිසි ක්‍රියාව නතර කරයි.
4) රුධිරයේ CO_2 සාන්ද්‍රනය වැඩිවීමෙන් රුධිර pH අගය වැඩිවේ.
5) ශ්වසන යාමනය සඳහා මොල වෘන්තයේ කොටසක් ද දායක වේ.

(31) වෘක්කානුවේ අවිදූර සංවලිත නාලිකාව මගින් ඉටු නොවන ක්‍රියාවලිය වනුයේ;

1) K^+ ප්‍රතිශෝෂණය කරයි
2) Na^+ අන්තරාල තරලය තුළට ඇතුළු කරයි.
3) ජලය වැඩිම ප්‍රමාණයක් ප්‍රතිශෝෂණය වේ.
4) HCO_3^- ප්‍රතිශෝෂණය කරයි.
5) K^+ සාන්ද්‍රනය යාමනය කරයි.

(32) ස්නායු ආවේග ජනනය හා සම්ප්‍රේෂණය පිළිබඳ අසත්‍ය වන්නේ;

1) අනස්සව කාල තුළ සෝඩියම් නාලිකා වැසී පවතී.
2) අක්‍රිය විභවය පවතින විට නියුරෝනය ඇතුළත ඉහළ K^+ සාන්ද්‍රනයක් පවතී.
3) විධ්‍රැවනයේදී Na^+ සෛලය ඇතුළට ගලා ඒ.
4) අක්සන ඔස්සේ ස්නායු ආවේග සන්නයනය වන වේගය එහි විශ්කම්භය වැඩිවීමත් සමග වැඩි වේ.
5) සෝඩියම්- පොටැසියම් පොම්පය ATP භාවිතා නොකරයි.

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

(33) ප්‍රතිශක්තිය පිළිබඳ නිවැරදි වගන්තිය තෝරන්න.

1) කෘතිම පරිචිත අක්‍රිය ප්‍රතිශක්තිය ජීවිත කාලය තුළම පවතී.
2) ස්වභාවික පරිචිත අක්‍රිය ප්‍රතිශක්තිය මව්කිරි මගින් දරුවාට ලැබේ.
3) කෙටි කාලීනව ඇතිවන ප්‍රතිශක්තියකි; සක්‍රිය ප්‍රතිශක්තිය.
4) වෙනත් ජීවියෙකු විසින් නිපදවන ලද ප්‍රතිදේහ තවත් ජීවියෙකුගේ ජීවියෙකුගේ දේහයට ලැබීමෙන් ඇතිවන දිගුකාලීන ප්‍රතිශක්තිය අක්‍රීය ප්‍රතිශක්තිය යි.
5) බෙලහීන කළ ව්‍යාධිජනකයන් එන්නත් කිරීම මගින් ඇති වන්නේ කෘතිම පරිචිත අක්‍රිය ප්‍රතිශක්තියයි.

(34) තයිරොයිඩ් ග්‍රන්ථිය ශ්‍රාවය කරන හෝර්මෝන සහ තයිරොයිඩ් ග්‍රන්ථිය මත ක්‍රියා කරන හෝර්මෝන සම්බන්ධව වැරදි ප්‍රකාශය තෝරන්න.

1) GH තයිරොයිඩ් ග්‍රන්ථිය මත ක්‍රියා කරයි.
2) TSH මගින් කැල්සිටොනින් ශ්‍රාවය උත්තේජනය කරයි.
3) TSH මගින් තයිරොයිඩ් ග්‍රන්ථියේ වර්ධනය උත්තේජනය කරයි.
4) ට්‍රයිඅයඩොතයිරොනීන් සාමාන්‍ය රුධිර පීඩනය පවත්වා ගැනීමට දායක වේ.
5) GHRIH මගින් තයිරොයිඩ උත්තේජක හෝමෝන ශ්‍රාවය නිශේධනය කරයි.

(35) පිටියුටරි ග්‍රන්ථියෙන් ශ්‍රාවයවන පෝෂී හෝමෝනයක් නොවන්නේ කවරක්ද?

1) LH
2) GnRH
3) FSH
4) TSH
5) ACTH

22 A/L අපි [papers g

(36) ප්‍රතිශක්තියෙදී දායකවන T හා B වසා සෛල වර්ග දෙකම පිළිබඳව සත්‍ය ප්‍රකාශය වන්නේ;

1) සහජ මෙන්ම පරිචිත ප්‍රතිශක්තියෙදී දායක වේ.
2) සක්‍රිය වූ විට ප්‍රතිදේහ නිපදවයි .
3) එකම එපිටෝපය අඩංගු ව්‍යාධිජනකයෙකුට සෛල වර්ග දෙකම ප්‍රතිචාර දක්වයි.
4) ව්‍යාධිජනකයෙකුට එරෙහිව සෛල මාධ්‍ය ප්‍රතිශක්ති ප්‍රතිචාර ඇති කරයි.
5) ස්වභාවික ව්‍යාධිජනක ආසාදනයකදී පමණක් සක්‍රිය වේ.

(37) අපිච්ඡද පටක වර්ගය හා හා පිහිටන ස්ථානය නිවැරදිව ගලපා ඇත්තේ;

1)	ව්‍යාජස්ථරීභූත	-	යෝනි මාර්ගය
2)	සරල ස්ථම්භික	-	හෘදය
3)	ස්ථරීභූත ශල්කමය	-	ස්වාසනාල
4)	සරල ඝනාකාර	-	වෘක්ක නාලිකා
5)	සරල ශල්කමය		නාස් මාර්ගය

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

(38) මිනිස් කන පිළිබඳ අසත්‍ය වන්නේ;

1) අණ්ඩාකාර හා ගෝලාකාර ගවාක්ෂය මැද කන හා ඇතුළු කන අතර මධ්‍ය බිත්තියේ ඇත.
2) අලින්දයේ පාර්ශ්වික බිත්තියේ අණ්ඩාකාර ගවාක්ෂය හා ගෝලාකාර ගවාක්ෂය පිහිටා ඇත.
3) කුම්භිකාව හා මඩිච්චිය අලින්දයේ පිහිටි මඩි දෙකකි.
4) ධරණකය ගෝලාකාර ගවාක්ෂය හා ස්පර්ශව ඇත.
5) නිඝාතය අණ්ඩාකාර ගවාක්ෂය හා ස්පර්ශව ඇත.

(39) මිනිස් සමේ ගැඹුරින් ඇති විශාල පීඩන වෙනස්කම්වලට සංවේදී වන යාන්ත්‍රික ප්‍රතිග්‍රාහකයකි;

22 A/L අපි [papers gr

1) මර්කල් මඩල
2) මීස්නර් දේහාණු
3) පැසීනියන් දේහාණු
4) නිදහස් ස්නායු අන්ත
5) රෆිනි දේහාණු

(40) මිනිස් ඇස පිළිබඳ අසත්‍ය වගන්තිය තෝරන්න.

1) දෘෂ්ටි විතානයේ කේතුවලට වඩා වැඩි ප්‍රමාණයක් යෂ්ටි ඇත.
2) රොඩොප්සින්වලට වර්ණ වෙනස හඳුනාගත නොහැක.
3) රාත්‍රියේ පෙනීම ලබා දෙන්නේ රොඩොප්සින් මගිනි
4) යෂ්ටි සෛලවල ෆොටොප්සින් අඩංගුය.
5) දෘශ්‍ය වර්ණාවලිය කෙරෙහි වෙනස් වූ සංවේදීතාවක් දක්වන කේතු සෛල වර්ග ඇත.

- අංක (41) සිට (50) තෙක් ප්‍රශ්නවල දී ඇති ප්‍රතිචාර අතුරෙන් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ නිවැරදි ය.කවර ප්‍රතිචාරය/ප්‍රතිචාර නිවැරදිද යන්න පළමුවෙන් ම විනිශ්චය කරගන්න.ඉන්පසු නිවැරදි අංකය තෝරන්න

(1)	(2)	(3)	(4)	(5)
A), (B), (D) නිවැරදි ය.	(A),(C),(D) නිවැරදි ය.	(A), (B) නිවැරදි ය.	(C), (D) නිවැරදිය	වෙනත් කිසියම් ප්‍රතිචාරයක් හෝ ප්‍රතිචාර සංයෝජනයක් හෝ නිවැරදි ය.

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources
iexamhub

(41) පෙප්ටයිඩ බන්ධන සහිත සංඝටකය/සංඝටක වන්නේ:

A) කොලැජන්
B) ග්ලයිකොප්‍රෝටීන්
C) කොලෙස්ටරෝල්
D) රයිබොසෝම
E) ග්ලයිකොලිපිඩ

(42) සිනිඳු අන්තඃප්ලාස්මීය ජාලිකා හා රළු අන්තඃප්ලාස්මීය ජාලිකාවලට පොදු කෘත්‍යය/කෘත්‍යයන් වන්නේ:

A) විෂහරණයට දායක වීම.
B) ලිපිඩ සංශ්ලේෂණය
C) ග්ලයිකොප්‍රෝටීන සංශ්ලේෂණය.
D) තම පටල වර්ධනය පහසු කිරීම.
E) පරිවහන ආශයිකා නිපදවීම.

(43) ක්ෂුද්‍ර සූත්‍රිකා පිළිබඳව සත්‍ය වගන්තිය/ වගන්ති වනුයේ:

A) ඇක්ටින් නම් ප්‍රෝටීන උප ඒකකය අන්තර්ගතය.
B) කුහරමය නාල වේ.
C) ඡේදන ඇලිය සෑදීමට ඉවහල් වේ.
D) වර්ණදේහ චලනයට උදව් වේ.
E) සෛල සචලතාවයට උදව් වේ.

(44) මහා අණුවක් ලෙස සැලකිය හැක්කේ.

A) ලිපිඩ
B) කාබෝහයිඩ්‍රේට
C) DNA
D) එන්සයිම
E) රයිබියුලෝස

(45) බීජ නොදරන සනාල ශාකවල වැදගත් ලක්ෂණයක්/ලක්ෂණ නොවන්නේ:

A) ශෛලම පටකය වාහිනිකා තන්තු හා මෘදුස්තර සෛලවලින් සමන්විත ය.
B) ක්ෂීණවූ ජන්මාණු ශාකයක් තිබීම.
C) ක්ෂුද්‍ර පත්‍ර හා මහා පත්‍ර ඇත.
D) බීජාණු පත්‍ර දරන අතර බොහෝ ශාක සමබීජාණුකතාව පෙන්වයි.
E) අණ්ඩ හා ශුක්‍රාණු නිපදවයි.

22 A/L අපි [papers grp]

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

(46) බහිර්ජන්‍ය බීජාණු නිපදවන දිලීර වනුයේ;

A) *Mucor*
B) *Rhizopus*
C) *Aspergillus*
D) *Agaricus*
E) *Chytridium*

(47) ආත්‍රපෝඩා වංශයේ ලාක්ෂණික ලක්ෂණයක්/ලක්ෂණ වන්නේ;

A) විවෘත රුධිර සංසරණ පද්ධතියක් ඇත.
B) උදරීයව ඛණ්ඩනය වූ කුහරමය ස්නායු රැහැනක් ඇත.
C) හොඳින් විකසනය වූ ස්නායු පද්ධතියක් ඇත.
D) බහිස්‍රාවයට මැල්පිගීය නාලිකා යොදාගනී.
E) යූරියා බහිස්‍රාවය කරයි.

(48) ශාකවලට අවශ්‍ය අධිමාත්‍ර මූල ද්‍රව්‍ය හා කෘත්‍ය අතර නිවැරදි ගැලපුම පෙන්නුම් කරන්නේ;

A) N - හරිතපුද වල සංඝටකයකි .
B) K - එන්සයිම සහ සාධක වීම.
C) Ca - බොහෝ එන්සයිම සක්‍රීය කිරීම.
D) S - සමහර ඇමයිනෝ අම්ලවල සංඝටකයකි.
E) Mg - ක්ලෝරොෆිල් අණුවල සංඝටකයකි.

(49) මිනිස් මොළය සම්බන්ධව අසත්‍ය ප්‍රකාශය/ප්‍රකාශ තෝරන්න.

A) සුෂුම්නා ශීර්ෂකය තුළ හෘත්සනාල මධ්‍යස්ථානය ඇත.
B) මස්තිෂ්ක වෘන්තය ; මධ්‍ය මොළය බැරෝලි සේතුව හා සුෂුම්නා ශීර්ෂකයෙන් තැනී ඇත.
C) මස්තිෂ්කයේ මතුපිට ධූසර ද්‍රව්‍ය ඇත.
D) හයිපොතැලමස ස්නායු තන්තු මගින් පිටියුටරි ග්‍රන්ථියට සම්බන්ධය.
E) කැලෝස දේහය ධූසර ද්‍රව්‍ය හා ශ්වේත ද්‍රව්‍යවලින් සමන්විතයි.

(50) ස්නායු සම්ප්‍රේෂක වනුයේ;

A) සමහර කීටෝන
B) නියුක්ලියෝසයිඩ
C) නියුරෝපෙප්ටයිඩ්
D) ජෛවජනන ඇමීන
E) සමහර අකාබනික අයන

22 A/L අපි [papers grp]

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources